# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1863/7 - 2014 මැයි මස 19 වැනි සඳුදා - 2014.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ පැලියගොඩ නගර සභාවේ උප සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම

උප සභාපති, සභාපති ධුරයට පත්වීම හේතු කොට ගෙන පැලියගොඩ නගර සභාවේ උප සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ, උප සභාපති වන අමිල නිශාන්ත කුමාරසිංහ නම් වූ උප සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ පැලියගොඩ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ආනන්ද පුෂ්ප කුමාර කාලංචි දේවගේ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පැලියගොඩ නගර සභාවේ තේරීම්භාර නිලධාරී පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතන වල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආනන්ද පුෂ්ප කුමාර කාලංචි දේවගේ මහතා පැලියගොඩ නගර සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
පැලියගොඩ නගර සභාව.

2014 මැයි මස 19 වන දින,
මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

06- 34

1A - G 19567— 90 (2014/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ පුත්තලම නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන පුත්තලම නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 65 අ (2) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි එම්. ඒ. ආර්. ඉනාමුල් හසන් නම් වූ සභිකයා අයත් වන ස්වාධීන කණ්ඩායම් අංක 8හි නායකයාට දින තිහ (30) කාල පරිච්ඡේදයක් ඇතුළත පුත්තලම නගර සභාවේ සභිකයෙකු වශයෙන් පත් කිරීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන එම්. ඒ. ආර්. අලි සබ්රි මහතා ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පුත්තලම නගර සභාවේ තේරීම්භාර නිලධාරි පාක්‍යරාජා රගුනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) (ආ) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, එම්. ඒ. ආර්. අලි සබ්රි මහතා පුත්තලම නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පාක්‍යරාජා රගුනාදන්,
තේරීම්භාර නිලධාරි,
පුත්තලම නගර සභාව.

2014 මැයි මස 07 වන දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

06 - 35

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.